# සංස්කාරකගෙන්



## නව සිතුවිලි තුළින්

මෑතක සිට ලෝකයේ සෑම රටකම පාහේ ආහාර හිඟයක පෙරනිමිති පහළ වන්නට පටන්ගෙන ඇති බැව් කවුරුත් පාහේ නොයෙකුත් ක්‍රමවලින් දැනගෙන ඇතැයි සිතමු.

මෙම තත්ත්වයේ බලපෑම් වලට මුහුණ දීමට අප ද සූදානම් විය යුතුය. එමෙන්ම අපේ ආර්ථික තත්ත්වය හා විදේශ විනිමය සුරකීමේ අදහසින් සහල් ආනයනය නතර කිරීමට රජය බලාපොරොත්තු වෙයි.

අපේම යහපත උදෙසා රජය ගෙන ඇති මෙම තීරණය ක්‍රියාත්මක කළ හැක්කේ ජනතා සහයෝගය ලැබුණහොත් පමණි. මෙම අදහස සපුරාලිය හැක්කේ බත් වෙනුවට ගත හැකි වෙනත් ආහාර වර්ග වගා කළහොත් පමණි. ඒ සඳහා ගත හැකි අප රටේ වගා කළ හැකි බෝග රාශියකි. මයියොක්කා, බතල වැනි අල වර්ග හා ඉදල් ඉරිඟු, බඩ ඉරිඟු, මුං ඇට, සෝයා බෝංචි වැනි අතිරේක ආහාර බෝග වර්ග ද මේ අතුරින් මුල් තැනක් ගනී. මෙවැනි බෝග වර්ග කෙරෙහි මෑතක සිට අප රට ජනතාව තුළ විශාල උද්යෝගයක් ඇති වී තිබෙන බැව් විවිධ පෙදෙස්වල ගොවිතැන් කටයුතු නැරඹීමට ගිය අපට පැහැදිළි වූ කරුණකි.

නොබෝද කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල් වත්තක පවත්වන ලද ක්ෂෙත්‍ර දිනයක් මීට හොඳ නිදසුනකි. එම ප්‍රදේශයේ ඉතා සාර්ථක ලෙස කෙරෙන පොල් වගාවට පමණක් එම ඉඩම් සීමා නොකර ප්‍රයෝජනවත් අතිරේක ආහාර බෝග වර්ග වගා කිරීමට ද ඉඩම් හිමියන් තුළ විශාල උනන්දුවක් ඇතිවීගෙන යන බැව් පෙනේ. මෙම ක්ෂෙත්‍ර දිනයේදී පොල් වගාවක සාර්ථක ලෙස කරන ලද ඉදල් ඉරිඟු වගාවක් නැරඹීමට පමණක් නොව එයින් පිළියෙල කරන ලද විවිධ කැවිලි වර්ග වල රස බැලීමට ද අවට වතු හිමියන් හා රජයේ නිලධාරීන් විශාල පිරිසකට අවස්ථාවක් ලැබුණි. බත් අපට අත්‍යාවශ්‍ය ආහාරයක් යයි පැවති ගතානුගතික අදහස අත්හැරීමට මේ හොඳම අවස්ථාවකි.

මෙවැනි ආහාර බෝගවලින් උපරිම අස්වැන්නක් ගැනීමේ නිසි මඟ ගොවිකම් දෙපාර්තමේන්තුව විසින් පෙන්වා දී ඇත. වැඩි දියුණු වර්ග මෙන්ම නව දියුණු ගොවිතැන් ක්‍රම ද සොයා ගෙන ඇති අතර ඒවා ජනතාව අතරට පත් කිරීමට ද අපගේ ව්‍යාප්ති සේවය නිතර සූදානමින් සිටී. එවන් වර්ග හා ගොවිතැන් ක්‍රම පිළිබඳව මීට පෙර පළ වූ කලාපවලින් මෙන්ම වෙනත් උපදෙස් පත්‍රිකා හා ගුවන් විදුලි වැඩ සටහන් ආදිය මගින් ද ඔබ සෑහෙන දුරට දැනගෙන ඇතැයි සිතමු. දැන් අපට අවශ්‍ය වන්නේ ඒවා ක්‍රියාවට නැංවීමය.

කලක් සත්ව ආහාර වශයෙන් ප්‍රයෝජනයට ගත් බඩ ඉරිඟු හා ඉදල් ඉරිඟු වැනි ආහාර වර්ග අද වැදගත් මනුෂ්‍ය ආහාර බවට පත්ව ඇති හෙයින් සත්ව ආහාරවල හිඟයකට මුහුණ දීමට ද අපට සිදු වී ඇත. සත්ව පාලනය ද අපට අමතක කළ නොහැක්කකි. එබැවින් ඒ සඳහා හොඳම පිළිතුර නම් වෙනත් පෝෂ්‍යදායක සත්ව ආහාර බෝග වගා කිරීමයි.

දියුණුවක් යනු වෙනසක් බැව් මීට පෙර ද නොයෙක් වර අප විසින් සඳහන් කරන ලද්දකි. කාලයත් සමඟ අපේ සිතුම් පැතුම් ද වෙනස් විය යුතුය. ඒ සමඟ අපගේ කෑම, බීම ආදී හැමකම වෙනසක් විය යුතුය. නව දැනුමක් මත ගොඩ නැගුණු නව දියුණුවක් ලබා ගැනීමට කවුරුත් දිරි දැරිය යුතුය. අපේ ආහාර ප්‍රශ්නයට එකම විසඳුම නව ක්‍රමයට වගා කිරීම හා කාලයට ඔබින පරිදි ආහාර වේල පිළියෙල කර ගැනීමයි. අපේත්, රටේත් දියුණුව පිළිබඳ වැදගත් මෙවන් අදහස් සිහි කිරීමටත්, ක්‍රියාවට නැංවීමටත් අදිටන් කර ගනිමු.

## පාඨකයිනි!

* මේ ඔබේ සඟරාවයි.
* මෙය පහසුවෙන් ලබාගැනීමට අවශ්‍ය හැම පහසු කමක්ම සලසා ඇත.
* කරුණාකර ඔබගේ පිටපත ලබාගැනීම සඳහා ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක තැන හෝ කෘෂිකර්ම ව්‍යාප්ති සේවක තැන වෙත දැනුම් දෙන්න.